**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතිය - 2016 /2017**

-----------------------------------------------------------------------------------------------------------

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ (අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතියේ 2016 ඔක්තෝබර් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම්කරණ කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5768 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ I කොටස සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසි වල 4:09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශය, වර්තමානයේ වාරිමාර්ග, ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ/ මෙහෙයවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූයේ දේශගුණික අවදානම කෙරෙහි නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතුවීමට ඇති ඉඩඅවකාශ අවම කිරීම හා ආපදාවන්ට සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා වූ ධාරිතාවය වැඩිදියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,048 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 42 ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 සැප්තැම්බර් 05 දින ආරම්භ කරන ලද අතර 2019 මැයි 30 දින නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව සහ

(එ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ හා ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බවි සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැය ගත ප්‍රතිපාදන හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | කාලච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන් කිරීම | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩොලර් මිලියන | රු.මිලියන |
| ජා.සං.ස | 42.0 | 6,048 | 500 | 3.87 | 591.89 |
| ශ්‍රී ලංකා රජය | - | - | 02 | 0.01 | 1.30 |
| එකතුව | 42.0 | 6,048 | 502 | 3.88 | 593.19 |

## 3.2 භෞතික ප්‍රගතිය

අතිරේක මූල්‍යකරණය සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මූලිකවම දේශගුණික අවබලපෑම් වඩා අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා අවධානය යොමු කරන අතර එය දේශගුණික අවබලපෑම් අවම කිරීමේ යටිතල පහසුකම් වැඩිකිරීම හා ක්‍රියාත්මක කිරීමේ සහය යන ප්‍රධාන සංරචක 02 කින් සමන්විතවේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර පිළියෙල කළයුතු ශක්‍යතා අධ්‍යයන වාර්තා විගණනයේ අරමුණු සඳහා ලබාගත නොහැකිවිය. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඇගයීමට නොහැකි විය.

(ආ) සපයන ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පිරිනැමිය යුතු කොන්ත්‍රාත් පැකේජ 17 ක් අතරින් කොන්ත්‍රාත් පැකේජ 04 ක වැඩ 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වීමට නියමිතව තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත් යටතේ වැඩ වල ප්‍රගතිය සියයට 64 සිට සියයට 80 ත් අතර පරාසයක පැවති බව වාර්තා විය.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ හා ප්‍රතිස්ථාපන විශේෂඥ, සන්නිවේදන විශේෂඥ, පරිසර ආරක්ෂණ විශේෂඥ, මානව සම්පත් නිලධාරී යන ප්‍රධාන තනතුරු සහ සහයක කාර්ය මණ්ඩල තනතුරු කිහිපයක පුරප්පාඩු සහිතව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කර තිබුණි.

## 3.4 අභ්‍යන්තර විගණනය

----------------------

මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 10 හෝ ඊට වැඩි විදේශාධාර ව්‍යාපෘති සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කළයුතු වේ. කෙසේවුවද, ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පත්කළ අධ්‍යක්ෂවරයෙකු, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරයෙකු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු සහ මාර්ග සංවර්ධන අධිකාරියේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ හා වාරිමාර්ග, ජල සම්පත් සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන කමිටුවක් මගින් අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කරනු ලැබේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රමාණාත්මක සොයාගැනීම් සිදු කළ හැකිවන පරිදි විස්තරාත්මක විමර්ශනයන් කර නොමැති බව අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණ මගින් පෙන්නුම් කරනු ලැබේ. තවද, ඉහත සඳහන් කළ නිලධාරීන් බොහොමයක් ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධව කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ නිරත වන අතර එම නිසා ව්‍යාපෘතියේ මෙහෙයුම් පිළිබඳ ස්වාධීන විමර්ශන ක්‍රියාත්මක කර නොතිබුණි.